# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

9 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය

නම : ..........................................................................................................................

- අංක 01 සිට 20 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

### I කොටස

1) සමාජයක මූලික තැනුම් ඒකකය වන්නේ,
   1. පාසල    2. පල්ලිය    3. පවුල    4. පන්සල

2) ඇමරිකා එක්සත් ජනපදයේ පැවති වහල්භාවය ඉවත් කිරීමට කටයුතු කළේ,
   1. ඒබ්‍රහම් ලින්කන්    2. ජවහල්ලාර් නේරු
   3. ෆ්‍රැන්සිස් බේකන්    4. ශ්‍රීමත් රිචඩ් ස්ටීල්

3) රටක හෝ ජන සමාජයක සියලු දෙනාම අවනත විය යුතු රාජ්‍ය විසින් පනවනු ලබන සමස්ත රෙගුලාසි පද්ධතිය සරලව හඳුන්වන්නේ,
   1. ආගම    2. නීතිය    3. ජාතිය    4. සංස්කෘතිය

4) රටක් තම දේශ සීමාව තුළ බලපැවැත්වෙන පරිදි පනවනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන නීතිය,
   1. අන්තර් ජාතික නීතිය    2. සිරිත් විරිත්
   3. ව්‍යවස්ථා    4. දේශීය නීතිය

5) ආරක්ෂක හමුදා සම්බන්ධ පුද්ගල වගකීම් හෝ යුතුකමක් වන්නේ,
   1. කැරලි මර්දන කටයුතු වලට බාධා කිරීම.
   2. ආපදා සහන සේවා කටයුතු සඳහා සහය ලබා නොදීම.
   3. සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යාමට සහය වීම.
   4. රණවිර සුබසාධක කටයුතු වලට දායක නොවීම.

6) ආර්ථිකය තුළ සිදුවන ප්‍රධාන ක්‍රියාවලින් තුනෙන් එකකි.
   1. සේවා    2. කාර්මික    3. නිෂ්පාදනය    4. නව වගා ක්‍රම

7) අධ්‍යාපනයේ නවතම හඳුන්වා දීම වන්නේ,
   1. ගුරුගෙදර    2. ඊ-ලර්නින්    3. ගුවන් විදුලිය    4. පොත්පත්

8) යහජීවන ගුණාංගයකි.
   1. සවන් නොදීම.    2. කළ ගුණ නොසැලකීම.    3. අකාරුණික වීම.    4. පරිත්‍යාගශීලී බව

9) යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීමෙන් අත්විය හැකි අයහපත් ප්‍රතිඵලයකි.
   1. අපචාර වැඩිවීම.    2. නීතිගරුක වීම.    3. ධාර්මික බව.    4. අවංක බව.

10) සහජීවන ගුණාංගයකි.
   1. යුතුකම් ඉටු නොකිරීම.    2. අන්‍යයන්ට ගරු නොකිරීම.

3. සහයෝගයෙන් කටයුතු කිරීම. 4. වංක බව.

11) සමුපකාර ව්‍යාපාරයේ පියා වන්නේ,

1. රොබට් නොක්ස් 2. රොබට් බ්‍රවුන්රිග් 3. ප්‍රැන්සිස් බේකන් 4. රොබට් ඕවන්

12) සමුපකාරයේ ආදර්ශ පාඨය වනුයේ,

1. ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී 2. එකා සැමටත් සැම එකාටත්

3. විද්‍යා දදාති විනයං 4. අත්ථ දීපා විහරථ

13) 'ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි.' යන නිර්වචනය ඉදිරිපත් කළේ,

1. සීලර් 2. ඒබ්‍රහම් ලින්කන් 3. ජවහල්ලාර් නේරු 4. ප්‍රැන්සිස් බේකන්

14) ඈත අතීතයේ සිට සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වු රට වන්නේ,

1. ඉන්දියාව 2. ශ්‍රී ලංකාව 3. ජපානය 4. ග්‍රීසිය

15) ඇතන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වුයේ,

1. කොංග්‍රස් සභාව 2. පාර්ලිමේන්තුව

3. පුරවැසි සභාව 4. ව්‍යවස්ථාදායකය

16) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ මුලික ලක්ෂණයකි.

1. සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම. 2. ජනමාධ්‍ය නිදහස නොමැතිවීම.

3. බහුතර කැමැත්ත මත තීරණ නොගැනීම. 4. නිදහස් හා සාධාරණ මැතිවරණ නොපැවැත්වීම.

17) ද්වි පක්ෂ ක්‍රමය පවතින රටකි,

1. ශ්‍රී ලංකාව 2. උතුරු කොරියාව 3. කියුබාව 4. ඇමරිකා එක්සත් ජනපදය

18) බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටක් වන්නේ,

1. උතුරු කොරියාව 2. ශ්‍රී ලංකාව 3. කියුබාව 4. ඇමරිකා එක්සත් ජනපදය

19) ශ්‍රී ලංකාවේ ඡන්ද බලය ලබා ගැනීම සඳහා සපුරාගත යුතු සුදුසුකමකි.

1. පුරවැසිභාවය අහිමිවීම. 2. ප්‍රජා අයිතිය අහෝසි කර තිබීම.

3. වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. 4. මරණීය දණ්ඩනය නියම වු පුද්ගලයෙකු වීම.

20) ශ්‍රී ලාංකිකයන්ට සීමිත ඡන්ද බලය හිමිවුයේ,

1. 1931 2. 1910 3. 1958 4. 1921

(ලත 20 x 2 - 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1) i) සෑම සමාජයකටම පොදු ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

ii) සමාජ සුරක්ෂිතතාව සරලව හඳුන්වන්න. (ල. 03)

iii) නිතීය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදිය හැකි කොටස් 2 ලියන්න. (ල. 02)

iv) සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා නිතී සැකසීමේදී විවිධ නිතී මුලාශ්‍ර යොදාගෙන ඇත. ඒවාට උදාහරණ 2 ක් ලියන්න. (ල. 02)

v) 'තාක්ෂණය' සරලව හඳුන්වන්න. (ල. 02)

vi) තාක්ෂණික වෙනස්වීම සමඟ ඇතිවු සමාජ වෙනස්කම් 3 ක් ලියන්න. (ල. 03)

vii) කෘෂිකාර්මික අංශය තුළ බිහිවූ නවීනතම වෙනස්කම් 2 ක් ලියන්න. (ල. 02)

2) i) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන 2 ක් නම් කරන්න. (ල. 02)

ii) සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු කාර්යයන් 4 ක් ලියන්න. (ල. 04)

iii) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන සමාජ ආයතන 3 ක් නම් කර ඉන් එකක දායකත්වය විස්තර කරන්න. (ල. 05)

3) i) 'දේශීය නීතීය' යන්න හඳුන්වන්න. (ල. 02)

ii) අපරාධ නීතීය යටතට ගැනෙන වැරදි 4 ක් නම් කරන්න. (ල. 04)

iii) නීතීය බලාත්මක කිරීම සඳහා පවතින ආයතන 3 ක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.05)

4) i) තාක්ෂණික වෙනස්වීම නිසා ඇතිවන හිතකර බලපෑම් 2 ක් ලියන්න. (ල. 02)

ii) තාක්ෂණික වෙනස්වීම නිසා ඇතිවන අහිතකර බලපෑම් 4 ක් ලියන්න. (ල. 04)

iii) වර්තමානයේ තාක්ෂණය යොදා ගැනෙන අවසථා 3 ක් නම් කර ඉන් එකක් සඳහා තාක්ෂණය යොදා ගන්නා ආකාරය ලියන්න. (ල. 05)

5) i) නව ප්‍රවණතා ඔස්සේ විවෘත වන රැකියා අවස්ථා 2 ක් ලියන්න. (ල. 02)

ii) රැකියා වෙළඳපොළෙහි පවතින නව ප්‍රවණතා වලට සරිලන අයුරින් තම සුදුසුකම් සපුරා ගැනීමේදී සම්පූර්ණ කරගත යුතු කරුණු 2 ක් ලියන්න. (ල. 04)

iii) කාලීන වෙනස්වීම් සමඟ රැකියා වෙළඳපොළෙහි විවිධ රැකියා සඳහා පවතින ඉල්ලුම වෙනස්වීමට බලපා ඇති කරුණු 3 ක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

6) i) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප 2 නම් කරන්න. (ල. 02)

ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් 4 ක් නම් කරන්න. (ල. 04)

iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ 5 ක් ලියන්න. (ල. 05)

7) i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මැතිවරණ ක්‍රම 2 ක් ලියන්න. (ල. 02)

ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද බලය අහිමි වීමට බලපාන හේතු 4 ක් සඳහන් කරන්න. (ල. 04)

iii) පුරවැසියකු වශයෙන් ජාතිය ගොඩනැගීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 5 ක් ලියන්න. (ල. 05)